සීඒ/6/1/20/21-3 2021.07.

අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් වෙත

## අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය -2021

රාජ්‍ය ආයතනවල සේවයේ නිරත නිලධාරීන්ගේ නිර්මාණ හැකියාව ඔප් නැංවීම, ඇගැයීම සහ එම නිර්මාණ එළි දැක්වීමේ අවස්ථාව උදා කිරීම සහ එමගින්, රාජ්‍ය ආයතනවල සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මෙවරද අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.
ඒ අනුව, සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් ළමා කතා, පද්‍ය රචනා, ගීත රචනා, චිත්‍ර, කෙටිකතා, කෙටි චිත්‍රපට, ඡායාරූප සහ කෙටි නාට්‍ය යන අංශ යටතේ මෙම තරගාවලිය පැවැත්වේ. එම තරගාවලිය පිළිබඳ විස්තර ඔබගේ දැන ගැනීම සඳහා මෙහි පහතින් දක්වා ඇත.

### 01. පොදු කොන්දේසි -

**මෙහි මතු සඳහන් පොදු කොන්දේසි සියලුම තරග සඳහා අදාළ වේ. ඒ ඒ තරගයට අදාළ විශේෂ හා පොදු කොන්දේසිවලට තරගකරුවන් එකඟ විය යුතුය. තරග සඳහා ඉදිරිපත් වීමම අදාළ කොන්දේසි සඳහා එකඟ වීමක් ලෙස සැලකේ.**

1. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සේවයේ හා අර්ධ රාජ්‍ය සේවයේ නිරත ඕනෑම අයෙකුට මෙම තරගාවලියට ඉදිරිපත් විය හැකි අතර, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ එයට අනුබද්ධ සියලුම ආයතනවල නිලධාරීන්ට මේ සඳහා සහභාගී විය නොහැකි බව කාරුණිකව සඳහන් කරමි. එසේම, රාජ්‍ය සේවයේ නිරතව සිට සාමාන්‍ය ක්‍රමවේදය පරිදි විශ්‍රාම ගිය ඕනෑම අයෙකුට මෙම තරගයේ අනු තරග ශීර්ෂයක් වන විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ නිර්මාණ තරගාවලියට ඉදිරිපත් විය හැකිය.

2. ඡායාරූප තරග අංශය හැර අනෙකුත් තරග ශීර්ෂයක් යටතේ තරගකරුවකුට එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කිරීමට හැකියාව ඇති අතර උපරිම වශයෙන් තරග ශීර්ෂයන් 3ක් යටතේ නිර්මාණ ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

3. ගීත රචනා, පද්‍ය රචනා, කෙටිකතා හා කෙටි නාට්‍ය අත්පිටපත් A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්තේ පරිගණක ගත කර තිබිය යුතු ය. සියලුම නිර්මාණ එෆ්එම් අභය අක්ෂරයෙන් පරිගණක ගත කළ යුතු වේ. ගීත රචනා, පද්‍ය රචනා, කෙටිකතා හා කෙටි නාට්‍ය අත්පිටපත් සඳහා අක්ෂරයේ ප්‍රමාණය ඒකක 12 විය යුතු ය. ළමා නිර්මාණ සඳහා අක්ෂරයේ ප්‍රමාණය ඒකක 16ක් විය යුතු ය.

4. අයදුම්පත්‍රයේ හැර නිර්මාණයෙහි තරගකරුගේ නම හෝ ඔහුගේ ආයතනය හෝ ඔහු පිළිබඳ හෝ කිසිදු සඳහනක් අන්තර්ගත නොකළ යුතු වේ. කිසියම් හෙයකින් එසේ යම් සඳහනක් අදාළ නිර්මාණයෙහි අන්තර්ගත වී නම් එම නිර්මාණය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. යොමු කරන නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර පරිවර්තන හෝ අනුවර්තන නො විය යුතුය.

6. කිසියම් ජාතියකට, ආගමකට සහ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ චරිතයට අපහාස වන පරිද්දෙන් හෝ, යම් පුද්ගලයකු හෝ පිරිසක් පීඩාවට හෝ අපහසුතාවට පත් කරන හෝ රජය හෝ රජයේ ප්‍රතිපත්ති විවේචනය කෙරෙන පරිදි නිර්මාණ ඉදිරිපත් නො කළ යුතු අතර එවැනි නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ. ජාතික සමගිය හෝ ආගමික සහජීවනයට බාධා වන කිසිදු නිර්මාණයක් බාර ගනු නොලැබේ. යම් හෙයකින් මෙවැනි නිර්මාණයක් තරගය සඳහා ඉදිරිපත් කිරීමෙන් යම් ගැටලුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වගකීමට බැඳෙන්නේ නැත. එම වගකීම අදාළ නිර්මාණකරු සතුවේ.

7. ප්‍රමාද වී ලැබෙන සහ තරග කොන්දේසිවලට පටහැනි නිර්මාණ පෙර දැනුම් දීමකින් තොරවම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ජයග්‍රාහී නිර්මාණවල පූර්ණ අයිතිය නිර්මාණ ශිල්පියා සතු වන අතර ඒවායේ ප්‍රචාරණ අයිතිය සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතුවේ.

9. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය පිළිබඳ සියලුම ප්‍රතිපත්තිමය තීරණ හා අවසාන වගකීම සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සතුවේ.

**තරග විනිශ්චය - පොදු කොන්දේසි**

10. සිංහල, දෙමළ මාධ්‍ය දෙකෙන් වෙන් වෙන් වශයෙන් පැවැත්වෙන ඒ ඒ තරග අංශවලට ප්‍රවීණ විද්වත් විනිශ්චය මණ්ඩලයක් විසින් විනිශ්චය කරනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

11. නියමිත ප්‍රමිතියට අනුකූල නිර්මාණ මෙම තරගය සඳහා නොලැබුණ හොත් මෙම තරගයට නියමිත ත්‍යාග, සහතික හෝ සම්මාන නම් නොකර සිටීමට විනිශ්චය මණ්ඩලයට පූර්ණ අයිතිය හිමිවේ.

12. තරග කොන්දේසිවලට පටහැනි අයුරින් නිර්මාණයක් ඉදිරිපත් කර ඇති බව සනාථ වුව හොත් සම්මාන ලබා දීමෙන් පසුවද එම ජයග්‍රහණ අවලංගු කර සම්මාන නැවත කැඳවීමට කටයුතු කෙරේ. තරග වංචා කරන නිර්මාණකරුවන් අසාදු ලේඛන ගත කිරීමට (Black List) කටයුතු කරනු ඇත.

**නිර්මාණ ඉදිරිපත් කිරීම - පොදු කොන්දේසි**

13. මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍රය නියමිත පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානිගේ නිර්දේශය සමඟ නිර්මාණ ඉදිරිපත් කළ යුතුය. ආයතන ප්‍රධානින්ගේ නිර්දේශය, නිල මුද්‍රාව හා අත්සන රහිත නිර්මාණ බාර ගනු නො ලැබේ. විශ්‍රාමික රාජ්‍ය සේවකයන් සඳහා වන තරගය සඳහා ඉදිරිපත් වන්නන් තමන් පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුවේ.

14. සෑම නිර්මාණයක් සමඟම වෙන වෙනම ඉල්ලුම් පත්‍රය බැගින් අමුණා එවිය යුතුය.

15. ඉහත පරිදි ඉදිරිපත් කරන සියලුම නිර්මාණ, **ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, 8වන මහල, සෙත්සිරිපාය, I අදියර, බත්තරමුල්ල** යන ලිපිනයට **2021.11.15** දිනට පෙර තැපැල් මාර්ගයෙන් එවීමට හෝ අතින්ගෙනැවිත් අමාත්‍යාංශයේ ප්‍රවර්ධන අංශයට බාර දීමට කටයුතු කළ යුතු අතර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවර **"අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය - 2021"** යනුවෙන් සඳහන් කර එයට පහළින් තමන් නිර්මාණය ඉදිරිපත් කරන තරග අංශය සඳහන් කළ යුතුය.

උදා - අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරගාවලිය -2021

තරග අංශය - කෙටි චිත්‍රපට

## 02. <u>තරග කොන්දේසි</u>

- **<u>සාහිත්‍යය</u>**

- **<u>කෙටිකතා</u>**
  - ➢ වචන 2000ක උපරිමයකට යටත් විය යුතු ය.

- **<u>ගීත රචනා</u>**
  - ➢ මිනිත්තු 3- 3 1/2 අතර ගැයෙන ගීතයකට යෝග්‍ය ගේය පද මාලාවක් විය යුතු ය.

- **<u>පද්‍ය රචනා</u>**
  - ➢ සඳැස් පද්‍ය රචනාවකදී පද්‍ය රචනය තුළ අඩංගු කාව්‍ය කොටස් උපරිම ලෙස දහයකට සීමා විය යුතු ය.

ඉහත තරග සඳහා ඕනෑම තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.

- **<u>ළමා නිර්මාණ (ළමුන් සඳහා වන සාහිත්‍ය නිර්මාණ)</u>**

I. ළමා කතා පොතක් හෝ ළමා ගී පොතක් චිත්‍ර ද සමඟ නිර්මාණය කළ යුතු ය.

II. වයස අවුරුදු 10ට අඩු ළමුන් සඳහා උචිත වන ධනාත්මක සිතිවිලිවලින් ළමා මනස සංවර්ධනය වන ආකාරයේ තේමාවක් රැගත් නිර්මාණ සරල බස් වහරින් ඉදිරිපත් කළ යුතු ය.

III. ඉලක්ක කණ්ඩායම වයස අවුරුදු 5 - 7 අතර දරුවන් සඳහා නම් උපරිමය පිටු 16ක් විය යුතු අතර වයස අවුරුදු 8 - 10 අතර දරුවන් සඳහා නම්, අවමය පිටු 16ක් සහ උපරිමය පිටු 32ක් විය යුතු ය.

- <u>චිත්‍ර නිර්මාණ</u>

    I. "සංවර්ධනයේ හදවත සංස්කෘතියයි " යන්න තේමාව විය යුතු අතර චිත්‍ර ඇඳීම සඳහා තමා කැමති මාධ්‍යයක් භාවිත කරමින් ඊට සුදුසු පෘෂ්ඨයක (කඩදාසි / බෝඩ් / කැන්වස්) චිත්‍රණය කළ හැකි ය.

    II. චිත්‍රය ප්‍රමාණය අඟල් 18 x 14 විය යුතුය.

- <u>සාහිත්‍ය හා චිත්‍ර තරග සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| • පද්‍ය රචනා<br>• ගීත රචනා<br>• කෙටි කතා<br>• ළමා නිර්මාණ<br>• චිත්‍ර | ප්‍රථම ස්ථානය | 25,000.00 |
| | දෙවන ස්ථානය | 20,000.00 |
| | තෙවන ස්ථානය | 15,000.00 |
| | සෑම තරග අංශයකින්ම කුසලතා ස්ථාන (05)ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයෙකුට රු.7,000.00 බැගින් |

- <u>කෙටි නාට්‍ය</u>

**(අ)** <u>තරග කොන්දේසි</u>

I. නාට්‍යයේ පසුතල නිර්මාණය, රංගවස්ත්‍ර නිර්මාණ, රංගාලෝකකරණය, සංගීත අධ්‍යක්ෂණය, වේදිකා පරිපාලනය සහ අංග රචනය යන ආනුෂංගික අංශ සඳහා පමණක් රාජ්‍ය සේවයට අයත් නොවන පුද්ගලයන් යොදවා ගැනීමට අවසර ඇතත් ඔවුහු සම්මාන ලැබීමට හිමිකම් නො ලබති. එසේ වුවත් නාට්‍ය සඳහා දායක වන සෙසු සියලු දෙනා රාජ්‍ය සේවකයන් විය යුතු ය.

II. මෙම චක්‍රලේඛය මගින් සුදුසුකම් නොලබන බවට දක්වා ඇති හෝ පූර්ව වශයෙන් මෙම තරගයට අදාළව සිදු කරන ලද යම් බරපතළ අක්‍රමිකතාවක්/ කොන්දේසි කඩ කිරීමක් හෝ මෙම තරගයේ

අපක්ෂපාතීභාවයට, සාධාරණ විනිශ්චයට, අඛණ්ඩතාවයට හා ජනතා විශ්වාසයට හානිවන පරිදි සිදු කරන ලද යම් ක්‍රියාවක් හේතුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ බලය පැවරූ නිලධාරියකු හෝ නිලධාරි මණ්ඩලයක් විසින් ලබා දුන් තීරණයක් මත හෝ මෙම තරගයට සහභාගිවීමට හිමිකම් නොලබන්නා වූ කවර හෝ පුද්ගලයෙක් තම නාට්‍යයට මැදිහත් කර නො ගැනීමට තරගයට ඉදිරිපත් කරන නාට්‍යයේ අධ්‍යක්ෂකවරයා වග බලා ගත යුතු ය. එවැනි පුද්ගලයෙකු නාට්‍යයට මැදිහත් වූ බවට සෑහීමකට පත් විය හැකි අවස්ථාවල එම නාට්‍යය සම්පූර්ණයෙන් ම තරගයෙන් ඉවත් කිරීමට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ට හෝ බලය පැවැරුණු මාණ්ඩලික නිලධාරියකුට බලය ඇත.

III. තරගය සඳහා ඉදිරිපත් වන සෑම තරගකරුවෙක් ම දෙවන වටයට සහභාගි වන අවස්ථාවේ දී,

- තමන් රාජ්‍ය සේවයේ ස්ථිර වැටුප් හිමි තනතුරක සේවය කරන බවට තමන් සේවය කරන ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.
- තම ජාතික හැඳුනුම්පත අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතු ය.
- රාජකාරි හැඳුනුම්පත් ඉල්ලා සිටින්නේ නම් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

IV. චක්‍රලේඛ ප්‍රකාරව මෙම තරගය සඳහා සහභාගි වීමට සුදුසුකම් ලබන්නකු හට එය සනාථ කිරීමේ වගකීම පැවරෙන අතර අදාළ තොරතුරු ඉල්ලා සිටින අවස්ථාවක ඉදිරිපත් කිරීමටත් සූදානම් ව සිටිය යුතු ය. අමාත්‍යාංශයේ ලේකම් හෝ අධිකාරිය පැවරුණු මාණ්ඩලික නිලධාරියෙකු සෑහීමට පත් වන අයුරින් එම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම සම්පූර්ණ නාට්‍යයම තරගයෙන් ඉවත් කිරීමට හේතුවක් වනු ඇත.

V. එසේම, යම් තරගකරුවකු සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් අදාළ නාට්‍යයෙහි අධ්‍යක්ෂ හා එම නාට්‍යය සඳහා සහභාගී වන කිසිවකු වසර 03ක කාලයක් සඳහා නැවත මෙම නාට්‍ය තරගාවලියට හෝ සංස්කෘතික අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන වෙනත් කිසිඳු නාට්‍ය තරගයක් සඳහා සහභාගී වීමට හිමිකම් නො ලබන්නේ ය.

VI. තරගය සඳහා ඉදිරිපත් කරනු ලබන නාට්‍යය, කවර මූලාශ්‍රයකින් ගත්තද ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර මහජන ප්‍රදර්ශනයට සුදුසු නාට්‍යයක් විය යුතුවේ.

VII. රංග කාලය උපරිමය මිනිත්තු 20ත් 30ත් අතර කාලයක පවත්වා ගැනීමට වග බලා ගත යුතුය. යම් හෙයකින් රංග කාලය වැඩිවීමක් හෝ අඩුවීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීමේ වගකීම විනිශ්චය මණ්ඩලය සතු වේ.

VIII. තරගයට ඉදිරිපත් කරනු ලබන නාට්‍යය, 2021 වර්ෂයේ නිෂ්පාදිත නාට්‍යයක් විය යුතු අතර, 2020 වසර හා ඊට පෙර වසරවලදී කිසිදු නාට්‍ය තරගයක් වෙනුවෙන් හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ වේදිකා ගත නො කළ නිර්මාණයක් විය යුතු ය.

IX. අවසාන වටය සඳහා නිර්දේශ වන නාට්‍ය, වේදිකා ගත කිරීමට පෙර ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ බලපත්‍රය අනිවාර්යයෙන්ම ලබාගත යුතු ය. අවසාන වටයේ තරග පැවැත්වෙන දිනයේ එහි පිටපතක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වන නාට්‍ය, තරගයෙන් ඉවත් කිරීමට සිදු වනු ඇත.

X. එක් තරගකරුවකුට දායක විය හැක්කේ එක් නාට්‍යයක් සඳහා පමණි.

XI. එක් නාට්‍යයක් සඳහා එකම ආයතනයක් මගින් සමස්ත ශිල්පීන් ඉදිරිපත් වීම අත්‍යාවශ්‍ය නො වන අතර, ඒ සඳහා සුදුසුකම් සපුරා ඇති ඕනෑම රාජ්‍ය සේවකයකු හට ඉදිරිපත් වීමට අවස්ථාව ඇත. එසේ වුවද, ලිපි ගනුදෙනු සිදු කෙරෙනුයේ නාට්‍යයේ අධ්‍යක්ෂක අයත් ආයතනය සමඟ පමණකි.

**(ආ) <u>තරගය පවත්වන ආකාරය සහ ලකුණු ලබා දීමේ පටිපාටිය</u>**

I. මෙම තරගය වට තුනකින් සමන් විත වන අතර **පළමු වටය පිටපත් සමීක්ෂණ** වටය වේ.

II. ඒ අනුව, තරගය සඳහා අත්පිටපත් කැඳවීම දිපව්‍යාප්තව සිදුකරනු ලබන අතර ඉදිරිපත් කරනු ලබන අත් පිටපත්, සමීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, වේදිකා ගත කිරීම සඳහා සුදුසු අත් පිටපත් 20ක් තෝරා ගනු ලැබේ.

III. එසේ පිටපත් සමීක්ෂණයෙන් තෝරා ගනු ලැබූ නාට්‍ය අත්පිටපත් දෙවන වටය සඳහා යොමු කෙරේ. ඒ අනුව දෙවන වටයේදී අදාළ නාට්‍ය වේදිකා ගත කිරීම සිදුවේ.

IV. දෙවන වටයේ වේදිකාගත කෙරෙන නාට්‍ය අතරින් අවසාන වටය සඳහා සුදුසු බවට විනිශ්චය මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන නාට්‍ය, අවසාන වටය සඳහා තෝරා ගැනේ. එම සංඛ්‍යාව දහයක් ඉක්මවා යන්නේ නම් ලකුණු ප්‍රමුඛතාව මත නාට්‍ය දහයක් පමණක් තෝරා ගැනේ.

V. එසේ වුවද, නොවැළැක්විය හැකි හේතූන් මත හෝ ප්‍රමාණවත් අත්පිටපත් සංඛ්‍යාවක් නොලැබීම මත හෝ ඉදිරිපත් වී ඇති නාට්‍ය ගුණාත්මක අතින් දුර්වල වීම හෝ අවස්ථානුගත හේතු මත මෙම

නාට්‍ය තරගය නොපැවැත්වීමට, කල්දැමීමට හෝ පිටපත් සමීක්ෂණ වටය හා අවසන් වටය ලෙස වට දෙකකින් සිදු කිරීමට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට තීරක බලය ඇත.

VI. පසුතල නිර්මාණය, රංග වස්ත්‍ර නිර්මාණය, සංගීත නිර්මාණය, රංග වින්‍යාසය, වේදිකා පරිපාලනය, රංගාලෝකකරණය, අංග රචනය, රංගනය, පිටපත් රචනය සහ අධ්‍යක්ෂණය යන සියලු ආනුෂංගික අංශ ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ.

VII. ඒ අනුව, දෙවන වටයේ ලකුණු ලබා දීමේ දී අංග රචනය, රංග වස්ත්‍ර නිර්මාණය සහ රංගාලෝකකරණය හැර උක්ත සියලුම ආනුෂංගික අංශ සලකා බැලෙන අතර, අවසන් වටයේ දී උක්ත අංක VI යටතේ ඇතුළත් සියලු ආනුෂංගික අංග ලකුණු ලබා දීමේ දී සලකා බලනු ලැබේ. එසේ වුවත්, සෑම තරග වටයක දී ම සියලු ආනුෂාංගික අංග ඇතුළත් ව උපරිම ප්‍රශස්ත මට්ටමින් ඉදිරිපත් කිරීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු ය.

VIII. නාට්‍ය තරගයේ ඕනෑම වටයකදී නාට්‍යයක් නියමිත දිනක නියමිත ස්ථානයක ප්‍රදර්ශනය කරන බවට එකඟව සිටියදී එය ප්‍රදර්ශනය කිරීමට අසමත් වන්නේ නම් අදාළ නාට්‍ය අධ්‍යක්ෂ තම කැමැත්තෙන් නාට්‍යය තරගයෙන් ඉවත්කර ගත් සේ සලකනු ලැබේ. එසේම තම නාට්‍යය නියමිත දිනට ප්‍රදර්ශනය කිරීමට නොහැකි නම් අවම වශයෙන් සතියකට පෙර ඒ බව දැනුම් දීම නාට්‍ය අධ්‍යක්ෂගේ වගකීම වේ.

IX. අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ කෙටි නාට්‍ය තරගාවලියේ කොන්දේසි කඩකිරීමක් පිළිබඳ පැමිණිල්ලක් වේ නම් නාට්‍ය රඟ දක්වා දින 03ක් ගත වීමට පෙර එය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව කරනු ලබන පැමිණිලි ප්‍රතික්ෂේප කෙරේ.

X. එසේම පැමිණිල්ලක් ඉදිරිපත් කරන විට එය ඉදිරිපත් කරන අය සිය අනන්‍යතාව සහිතව පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු අතර නිර්නාමිකව ඉදිරිපත් කරන පැමිණිලි ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කෙරේ.

XI. කෙටි නාට්‍ය තරගය සඳහා තෝරා ගනු ලබන නාට්‍ය පිළිබඳ යම් අයිතිවාසිකම් පෑමක් හෝ විරෝධය පෑමක් සිදුකරන්නේ නම් එය දිවුරුම් ප්‍රකාශයක් මගින් විධිමත්ව සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

XII. ඉහත X, XI යන වගන්ති ප්‍රකාරව ලැබුණු පැමිණිල්ලක හෝ අයිතිවාසිකම් පෑමක හෝ විරෝධය පෑමක සාධාරණභාවය පිළිබඳ සෑහීමට පත් විය හැකි අවස්ථාවල සම්මාන ප්‍රදානෝත්සවයෙන් පසුව වුවත් අදාළ නාට්‍යය/ නාට්‍ය සම්පූර්ණයෙන් තරගයෙන් ඉවත් කිරීමටත්, ලබා දුන් සම්මාන,

සහතික පත්‍ර, ත්‍යාග නැවත අය කර ගැනීමටත් අමාත්‍යාංශ ලේකම්ට හෝ අධිකාරිය පැවරුණු මාණ්ඩලික නිලධාරියකුට හෝ බලය ඇත.

- <u>**කෙටිනාට්‍ය තරඟ සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන**</u>

| ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|
| වසරේ ප්‍රශස්තම පසුතල නිර්මාණය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම රංග වස්ත්‍ර නිර්මාණය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම සංගීත නිර්මාණය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම රංග වින්‍යාසය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම අංග රචනය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම වේදිකා පරිපාලනය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම රංගාලෝකකරණය | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම කෙටිනාට්‍ය සහාය රංගනය-කාන්තා | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම කෙටිනාට්‍ය සහාය රංගනය- පිරිමි | 15,000.00 |
| වසරේ ප්‍රශස්තම කෙටිනාට්‍ය රංගනය-කාන්තා | 20,000.00 |
| වසරේ ප්‍රශස්තම කෙටිනාට්‍ය රංගනය- පිරිමි | 20,000.00 |
| ජූරියේ විශේෂ කුසලතා ඇගැයීම් (උපරිම දෙකයි) | 10,000.00 බැගින් |
| ස්වීය කෙටිනාට්‍ය රචනය තෙවන ස්ථානය | 15,000.00 |
| ස්වීය කෙටිනාට්‍ය රචනය දෙවන ස්ථානය | 20,000.00 |
| වසරේ ප්‍රශස්තම ස්වීය කෙටිනාට්‍ය රචනය | 25,000.00 |
| කෙටිනාට්‍ය අධ්‍යක්ෂණය තෙවන ස්ථානය | 15,000.00 |
| කෙටිනාට්‍ය අධ්‍යක්ෂණය දෙවන ස්ථානය | 20,000.00 |
| වසරේ ප්‍රශස්තම කෙටිනාට්‍ය අධ්‍යක්ෂණය | 25,000.00 |
| වසරේ විශිෂ්ටතම කෙටි නාට්‍යය | 50,000.00 |
| විශිෂ්ට කුසලතා ඇගැයීම් (උපරිම 5 යි) | 7000.00 බැගින් |

(ඇ.) <u>අයදුම් කිරීම</u>

- තරග සඳහා අත්පිටපත් ඉදිරිපත් කිරීමේ දී එය නාට්‍යයේ අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කළ යුතු අතර පහත දැක්වෙන ආකාරයට කටයුතු කළ යුතුය.

I. සෑම කෙටි නාට්‍ය අත්පිටපතක් ම පිටපත් 03කින් යුතුව එවීම අනිවාර්ය වේ.

II. තරග සඳහා අත්පිටපත් යොමු කිරීමේ දී A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පැත්ත පමණක් භාවිත කළ යුතු අතර, පරිගණක ගත කර ඉදිරිපත් කළ යුතු ය.

III. අධ්‍යක්ෂවරයා පිටපත් රචකයා නො වන කල් හි අදාළ නාට්‍යය නිෂ්පාදනය කිරීම සඳහා පිටපත් රචකයාගෙන් නාට්‍යයේ අධ්‍යක්ෂ වෙත බලය පැවරුණු ලිපියක් ඉදිරිපත් කළ යුතු වේ.

- <u>කෙටි චිත්‍රපට</u>

<u>තරග කොන්දේසි</u>

I. තරග සඳහා එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් කෙටි චිත්‍රපටයක් පමණි.

II. එය ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර මහජන ප්‍රදර්ශනයට සුදුසු කෙටි චිත්‍රපටයක් විය යුතු වේ.

III. එහි ධාවන කාලය උපරිම මිනිත්තු 12- 15 අතර කාලයකට සීමා විය යුතුය.

IV. එම කෙටි චිත්‍රපටය 2021 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද්දක් විය යුතු අතර, 2020 වසර හා ඊට පෙර වසරවලදී කිසිදු තරගයක් වෙනුවෙන් හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ දර්ශන ගත නො කළ නිර්මාණයක් විය යුතු ය.

V. මෙසේ තරගය සඳහා ඉදිරිපත් කරන කෙටි චිත්‍රපටය සිංහල හා දමිළ යන මාධ්‍ය භාෂා දෙකෙන් තමන් අභිමත භාෂා මාධ්‍යයකින් රූ ගත කර, පිටපත් තුනකින් DVD මාධ්‍ය තැටි මගින් පමණක් ඉදිරිපත් කළ යුතුවේ. (අදාළ තැටිවල ධාවන තත්වය පිළිබඳ වගකීම තරගකරුවන් සතුවේ. )

VI. කෙටි චිත්‍රපටයේ රංගනය, කලා අධ්‍යක්ෂණය, කැමරා අධ්‍යක්ෂණය, සංගීත අධ්‍යක්ෂණය, සංස්කරණය, අංග රචනය හා වස්ත්‍ර නිර්මාණය සහ නිෂ්පාදනය යන ආනුෂංගික අංශ සඳහා පමණක් රාජ්‍ය සේවයට අයත් නොවන පුද්ගලයන් යොදවා ගැනීමට අවසර ඇත.

VII. නිර්මාණ සඳහා වන මූලික වියදම තරගකරුවන් විසින් දැරිය යුතු අතර, අනුග්‍රාහකයකු යොදා ගැනීමට අවසර ඇත.

- **<u>කෙටි චිත්‍රපට තරග සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>**

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| කෙටි චිත්‍රපට | ප්‍රථම ස්ථානය | 25,000.00 |
| | දෙවන ස්ථානය | 20,000.00 |
| | තෙවන ස්ථානය | 15,000.00 |
| | කුසලතා ස්ථාන (05)ක් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයෙකුට රු.7,000.00 බැගින් |

- **<u>ඡායාරූප</u>**

**<u>තරග කොන්දේසි</u>**

I. ජන ජීවිතයට අදාළ දෛනික ජීවන කාර්යයන් පිළිබිඹු කෙරෙන හා විවිධ ජන වර්ග, ආගම් සහ සංස්කෘතිවලට අදාළ අංග නිරූපණය කෙරෙන ඡායාරූප මෙම තරගයට ඉදිරිපත් කළ හැකිය.

II. මෙසේ ඉදිරිපත් කරනු ලබන ඡායාරූප සංස්කරණය කළ නොහැකි අතර, ඒවායේ ස්වභාවික පෙනුමට හානි නොවන ලෙස දිග, පළල හා ආලෝක තීව්‍රතාව සකස් කළ හැකිය.

III. එක් තරගකරුවකුට තරගය සඳහා ඉදිරිපත් කළ හැකි උපරිම ඡායාරූප ප්‍රමාණය 03කි.

IV. ඉදිරිපත් කරනු ලබන ඡායාරූප වර්ණ (Color) හෝ ඒකවර්ණ (Monochrome) හෝ විය හැකිය. ඒවායේ දිග පැත්ත පික්සල් 1920ක් හෝ පළල පැත්ත පික්සල් 1080 විය යුතුය. එම

ඡායාරූප sRGB වර්ණ පරාසය යටතේ විය යුතුය. එක් ඡායාරූපයක උපරිම ප්‍රමාණය 2MB විය යුතුය.

V. කෘතියේ අන්තර්ගතයට අදාළ නොවන බාහිර සලකුණු කිසිවක් එනම් දිය සලකුණු, නම්, දින සලකුණු හා ලාංඡන ආදිය ඡායාරූපයේ අඩංගු වේ නම් එම ඡයාරූපය තරගයෙන් ඉවත් කරනු ලැබේ.

VI. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින ඕනෑම මොහොතක තරගය සඳහා ඉදිරිපත් කරන ඡායාරූපවල සංස්කරණය නොකරන ලද මුල් ගොනුව (RAW හෝ Native JPEG) ලෙස ඉදිරිපත් කිරීමට ඡායාරූප ශිල්පියා බැඳී සිටිය යුතුය. එලෙස ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහ ප්‍රමාද වන ඡායාරූප, තරගයෙන් ඉවත් කිරීමට හෝ ජයග්‍රහණය ලබා නොදීමට විනිශ්චය මණ්ඩලය තීරණය කරනු ඇත.

VII. තරගයට ඉදිරිපත් කරන සියලුම ඡායාරූප අදාළ ශිල්පියා විසින්ම ලබා ගන්නා ලද ඡායාරූප විය යුතුය. එහි බුද්ධිමය දේපළ අයිතිය සහ නිරූපණ හිමිකම පිළිබඳ නෛතික ගැටලුවක් මතු වුව හොත් ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය කිසි ලෙසකින් වගකීමට බැඳී නොසිටී.

VIII. එසේම එම ඡායාරූප, මින් පෙර කිසිදු තරගයක් වෙනුවෙන් හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ ඉදිරිපත් නොකළ ඡායාරූප විය යුතුය.

- <u>ඡායාරූප තරග සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| ඡායාරූප | ප්‍රථම ස්ථානය | 25,000.00 |
| | දෙවන ස්ථානය | 20,000.00 |
| | තෙවන ස්ථානය | 15,000.00 |
| | කුසලතා ස්ථාන (05)ක් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයෙකුට රු.7,000.00 බැගින් |

- **<u>විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ සාහිත්‍ය තරග</u>**

රජයේ සේවයෙහි නිරතව සිටි විශ්‍රාම ගිය ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවකයන් හට පමණක් මෙම තරගය සඳහා අයදුම් කළ හැකිවේ.

**තරග අංශ -**

- **<u>කෙටිකතා</u>**
  - වචන 2000ක උපරිමයකට යටත් විය යුතු ය.

- **<u>ගීත රචනා</u>**
  - මිනිත්තු 3- 3 1/2 අතර ගැයෙන ගීතයකට යෝග්‍ය ගේය පද මාලාවක් විය යුතු ය.

- **<u>පද්‍ය රචනා</u>**
  - සඳැස් පද්‍ය රචනාවකදී පද්‍ය රචනය තුළ අඩංගු කාව්‍ය කොටස් උපරිම ලෙස දහයකට සීමා විය යුතු ය.

ඉහත තරග සඳහා ඕනෑම තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

- **<u>විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ සාහිත්‍ය තරග සඳහා පිරිනමන මුදල් තිළිණ හා සම්මාන</u>**

| තරග අංශය | ස්ථානය | ත්‍යාග මුදල (රු) |
|---|---|---|
| • පද්‍ය රචනා<br>• ගීත රචනා<br>• කෙටි කතා | ප්‍රථම ස්ථානය | 25,000.00 |
| | දෙවන ස්ථානය | 20,000.00 |
| | තෙවන ස්ථානය | 15,000.00 |
| | සෑම තරග අංශයකින්ම කුසලතා ස්ථාන (05)ක් බැගින් තෝරා ගනු ලැබේ. | එක් ජයග්‍රාහකයෙකුට රු.7,000.00 බැගින් |

**03. <u>වෙනත්</u>**

1. **වසරේ විශිෂ්ටතම කෙටි නාට්‍යය ඉදිරිපත් කරන ආයතනයේ ආයතන ප්‍රධානියාටද විශේෂ ඇගැයුම් සම්මානයක් පිරි නැමේ.**
2. ඉහත සියලුම නිර්මාණවලින් ජයග්‍රහණ ලබාගන්නා අයට වටිනා සහතික පත්‍රයක් පිරිනැමේ.
3. මේ සමඟ එවනු ලබන දැන්වීම් පත්‍රිකාව ඔබගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන්න.
4. වැඩිදුරටත් තොරතුරු www.cultural.gov.lk වෙබ් අඩවියෙන් සහ ප්‍රවර්ධන අංශය දුරකතන අංක 011-2861325 / හර්ෂ රංගන 0759320163 / මහේෂා ඒකනායක 0718249272 යන දුරකථන අංකයන් අමතා විමසා ලබා ගත හැකි ය.

**දේශබන්ධු මහාචාර්ය කපිල ගුණවර්ධන**

ලේකම්

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය